# රස කවි සිතුවිලි



ENT'S
.148
ARY

ආර්. ප්‍රේමදාස

1246 809.148

# රස කවි සිතුවිලි

ආර්. ප්‍රේමදාස

ප්‍රකාශනය

දයාවංශ ජයකොඩි සහ සමාගම

101, ඇස්. මහින්ද මාවත, මරදාන, කොළඹ 10

10.04.90

## ආර්. ප්‍රේමදාස ලියූ පොත්

- *ඇති තතු*
- *සමාජ වාදය*
- *සූරිය ඔබයි*
- *රන් මිණි මුතු*
- *ජීවන කඳුළු*
- *ප්‍රේමදාස කතාකරයි*
- *රස කවි සිතුවිලි*
- *පෙමවතිය*
- *ජීවන කඳුළු චිත්‍රපට කතාව*
- *පෙරමග ලකුණු*
- *ඇතා ගේ කතාව*
- *හිතවතිය*
- *පරෙවියෝ ඉගිලෙති*
- *PRATAP THE ELEPHANT*
- *PIGEONS ON THE WING*
- *අගමැති සිතුවිලි*


| පරි. අංක | 1246 |
|---|---|
| වර්ග අංක | 809.148 |
| | |


යොමු අංකය: අ.ප්‍ර.ම./2/2112.

**බලපත්‍රය**

**රස කවි සිතුවිලි – ආර්. ප්‍රේමදාස**

1952 පෙබරවාරි මස 29 වැනි දින නිකුත් කරණ ලද ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ වූ උපකෘත, ස්වභාෂා, ද්විභාෂා හා ඉංග්‍රිසි පාඨශාලාවන් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ "19/ජ" ඡේදය යටතේ අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් තුමන් විසින් පුස්තකාල පොතක් වශයෙන් අනුමත කරන ලදී.

ඩ. ප. ආරියවංශ
අ. ග්‍ර. ප්‍ර. උ. ම. ලේකම්.

1978 මැයි මස 4 දින,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන උපදේශක මණ්ඩලයේ දිය.


මුද්‍රණය: සීමාසහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගම (මුද්‍රණකරුවෝ), කොළඹ 12 1210–12/80

# පූජාව

බාදක කොතෙකුත් මට හමු වූවා
එනමුදු ආවෙමි මැඩගෙන ඒවා
'රස කවි සිතුවිලි' මිලින නො වේවා
පොදු ජනතාවට පූජා වේවා

'සැනසුම'
සුචරිත මාවත
කොළඹ 12

ප්‍රථම මුද්‍රණය:		1976 අප්‍රේල්
දෙවෙනි මුද්‍රණය:		1981 පෙබරවාරි 4ද

'රස කවි සිතුවිලි'
සියලු හිමිකම් ආර්. ප්‍රේමදාස සතු ය

පිටකවරය:
**සෝමසිරි හේරත්**

# රස කවි සිතුවිලි

රං කුඩුවෙක ලා
රස බොජුන් මා කව ලා
තැබුවත් සනස ලා
ඉගිළ යන්නෙමි අහස සොය ලා

මව් පොළොව නමදිමි
එහි දුක් කඳුළු අමදිමි
නොං රට සැප නොයදිමි
මෙහි මැ යළි උපදින්න අයදිමි

තිර අදිටන් මගේ
යන කල ගැටලු අපගේ
හිරු දුටු පිනි වගේ
ලිහෙයි යහපත පිණිස සැමගේ

රට දූයට පිරියෙන්
අපි අපගේ ම දිරියෙන්
යන කල ඉදිරියෙන්
හිරු උදා වෙයි සියලු සිරියෙන්

මා මියෙන මොහොතේ
අවසන් කැලුම් දෙනෙතේ
මව් බිමේ නැවතේ
ඒ එළිය සදාහට ම පැවතේ

මහජන තුති බැති මල් පිළිගන්නේ
පිළිගත් පසු නැහැ අහක බලන්නේ
මහජනයා නම් දෙස් පවසන්නේ
ඒ හඬටත් මගෙ සිරස නැමෙන්නේ

❋

සමාජ වාදය යැයි පවසන්නේ
සිරිසැප දෙන මහටයි මිනිසුන්නේ
සමාජ වදයට කුමක් කියන්නේ
ගෙල සිඳලන මහ කඩුවක් වැන්නේ

❋

මපියාණන්ට මම දෙවි කෙනෙකුට වැඩිය
ගරු කොට වදින්නෙමි; පෙම එතරම් දැඩිය
ඔහු නෑ පිරෙව්වේ ඔහුගේ යටි මඩිය
එය වෙයි පියාණන් මට දුන් ජය කොඩිය

❋

මම මගෙ උදර පෝසණයට නො වෙහෙසෙමී
රට ජාතියේ මතු දියුණට සුරත දෙමී
සිඳලමි ඉඩ ලදෙත් එය බැඳි සියලු බැමී
එය කළ නොහැකි නම් නිහඬ ව ඉවත යමී

❋

වාසනාව වැඩ ඉන් නේ
විමන් තුළ ද දෙවියන් නේ ?
නැහැ! එය ලොව වැජඹෙන් නේ
උත්සාහෙයි මිනිසුන් නේ

පුතේ, දුවේ මේ අහන්න
නොවහල් දෙනෙතින් බලන්න
සුමඟ දිගේ පෙරට යන්න
යා හැකි දුර පා නඟන්න

පිපෙනා සුවඳ සිතුවිලි හද		වතේයා
පූජා කරන්නේ ජාතිය		වෙතේයා
එම කල සිතට මහ සතුටක්		සිතේයා
මිනිසුන් තරම් බලයක් ලොවැ		නැතේයා

ජය ලද වෙලේ ආඩම්බර		නොවේවා
පැරදුණු කලේ වත මුකුලිත		නොවේවා
දුක සැප දෙකේදිම හසරැලි		සැලේවා
සිතුවිලි කඩුව එඩිතර වී		දිලේවා

සරණයි සරණයි මහජන		සරණයි
එම සරණේ ඉර හඳ සේ		පොරණයි
නොවහල් බව ඔවුනගෙ		පිළිසරණයි
ඔවුන් පෙළන කල මගෙ සිත		උරණයි

ලද පසු උතුම් මහජනතාවගෙ		වරම
නො තකා ඔවුන් ගැන අබ ඇටයක්		තරම
බොනවට වඩා බලකාමෙහි හිම		කිරම
වහ බී මියෙනු රිසියෙමි මම එක්		වරම

මහජනයාට යුතුකම් ඉටු		කරන්නට
පසුබට නො වෙමි මා හිටියත් පියුම්		පිට
ඔවුනගෙ දෙපා යට ඔවුනට		පෙනෙන්නට
දූවිලි පොදක් වී තුටුවෙමි		තැළෙන්නට

❀

රජය රකුසෙකු		සේ
කඩුව ගත් කල		නොලසේ
වහල් නර බිලි		සේ
මහාජනයා අහෝ		වැනසේ

රෙදි වැලෙක වනනා
තෙත රෙදි විලස වැනෙනා
මිනිසුන් වැලපෙනා
සමාජය යම ලොවකි නොමනා

මහා ජනයා ගේ
සැපත පැතුමයි මාගේ
එහි සුවඳ ඕගේ
කිමිද තුටුවෙමි හසකු වාගේ

❋

හැම පිළිවෙතක ම පදනම වෙන්නේ
ජනතා සුවසෙත බව සලකන්නේ
සමාජ වාදය යැයි පවසන්නේ
එය මිස වෙන කිමෙකැයි විමසන්නේ

❋

දිව බොජුන් දිව සළු
මහා මන්දිර මනකලු
මට එපා – මට එපා
මගේ නිදහස පමණි
මා ඔබෙන් ඉල්ලන්නේ

❋

දෙනෙතින් දෙනෙතකට
නිහඬ බසකින් රස කොට
පැවසූ කවියෙ සිට
ආදරය බිහි වුණා මෙලොවට

❋

යොවුන් වියේ මල් උයනෙන් වඩින්නේ
සතුට වඩන රුව එසඳේ දිලෙන්නේ
එම රූ සපුව රැකගෙන වැඩ කරන්නේ
එසඳේ ඔබයි ජීවිතයෙන් දිනන්නේ

අග හිඟකම් නැති-
සමාජයක් ඇති-
කරන්න හිත ඇති-
නම් එය යහපති

❁

ඩහදිය හෙළනා කම්කරුවන් හට
පණ රැක ගන්නට වැටුපක් දුන්නට
එය නොම සෑහේ අවුල ලිහන්නට
ලාබෙන් කොටසක් ඇයි බැරි දෙන්නට ?

❁

ඉහට ඉහළින් පියාඹන්නට පියාඹන කපුටන්ට ඉඩ හැර
නිහඬ වන්නෙමු එය ඔවුන්ගේ අයිතියක් බව නැණින් සිහි කර
එහෙත් එම අයිතියේ මායිම මානයෙන් පිම්බිලා පසු කර
අපේ සිරසේ කුඩු බඳිනට අපි නොදෙන්නෙමු උන්ට අව සර

❁

පොදු ජනයාගේ පැන විසඳෙන්නේ
ඔවුන් විසින් දෙන සහය තුළින්නේ
එසේ නොවූ කල කිම සිදුවන්නේ
පැනය අවුල්වී ගිනි අරගන්නේ

❁

සිහිකර බුදුන් මා සිවුරට වදින කල
ඒ බුදු සිවුර අද පොරවන සිරුර තුළ
යහ ගුණ ඇතැයි සලකාගෙන සියලු කල
මා වදිනවා සඟගණ සිරිපා කමල

❁

පල මල් බරින් නිරතුරු අතු නැමුණු ගස
ඒවා බුදිනවද පොළොවට බෙදනු මිස
ජනතා වරම ලද යම් කිසිවකුගෙ හිස
එලෙසින් නැමිය යුතු වෙ ජන මතය දෙස

වළලා දෙපා යට නිම නැති කුසගින්න
මිනිසුන් පොළොව මත ජීවත් කරවන්න
දිවි නොතකමින් සේවය කොට මිය යන්න
මා ඉඩ ලදෙත්; එය, මට රජකම වැන්න

❀

මළමිනි ලොවේ ඇවිද්දන්නට නොවේ සකි පාලම් තනන්නේ
පණැති මිනිසුන් පමණි එමහින් එගොඩ මෙගොඩට ගමන් යන්නේ
ගඟේ දිය රැළි විලස නළියන නිහඬ සිතුවිලි හද සිඹින්නේ
ඔවුන්ගේ දියුණුවේ මාවත කියා දෙන්නයි මට සිතෙන්නේ

❀

පාසල කියන්නේ
කිමෙකැයි ඔබ සිතන්නේ
අපේ දරුවන්නේ
දියුණුවයි ඉන් බිහි කෙරෙන්නේ

නුවණ දෙන වාසල
තමයි දරුවනි පාසල
නිරෝගී මොළ තුළ
එයින් සිතුවිලි දූවෙනවා දූල

සිල්ප සතර හොඳින් උගෙන ගත හැකි නම් සැප මැවේය
ලෙඩදුක් නැති ළමා සිතට එමහින් විදු නැණ පෙවේය
පාසල යනු උතුම් තැනෙකි; නූගත්කම එහි දූවේය
හාමත් වූ මොළ ගෙඩිවල විලංගු ලන තැන නොවේය

❀

බත් කන්න ම නොවේ මිනිසුන් උපදින්නේ
එනමුත් කොයි ලෙසද පණනල රැක ගන්නේ ?
පිපුණට පසුයි සුවඳැති මල් දිස්වන්නේ
ඒවා නටුවෙ මැලැවෙන්න ද පිපෙන්නේ ?

මිනිසුන් තරම් මගෙ මේ මව් පොළොව මත
වටිනා වස්තුවක් වෙන මා දුටුයෙ නැත
ඒ වස්තුව ම රැක ගන්නට යොදමු හිත
සියලු ම ඉසුරු ඔවුනගෙ ඩහදියෙහි ඇත

❋

දරුවන් අද මව් පියන් වඳින්නේ
ඔවුන් තමන් දෙ ගුරුන් මැ බැව්න්නේ
උදර මිනිසුන් විලස ඔවුන්නේ
දෙපා වඳින්නත් පුරුදු වෙයන්නේ

❋

හිරු බසින අහසේ
යළි ඒ හිරු ම දිළිසේ
බලය එම විලසේ
ගිලිහි ගිලිහී නැවත පිවිසේ

❋

කිව් දේ කරන්නෙමි
කරන දේ පවසන්නෙමි
නොහැකි නම් යන්නෙමි
ජන සමාජෙට යළි නොඑන්නෙමි

❋

රුව නොමැති ළඳක් නම් – කවුරුවත් නෑ බලන්නේ
සවන රස නො දේ නම් – ගීතයක් සිත් ගනී දෝ
නෙත ළඟ ම පිපිලා – ගේ දිහාවේ බැලුවත්
සුවඳ නැති මලක් නම් – කව්රුවත් නැහැ නෙළන්නේ

❋

රූපය නොමැති කල
තරුණියකගේ කෝමල
ගුණ සුවඳ ළය තුළ
ඇතොත් සපිරෙයි ඇගේ මන දෙළ

කඳුළු බිඳු සලාවින් – වේදනාවෙන් ළඟා වූ
මරණයයි කියන්නේ – විස්මයක් නම් නො වේ මැයි
නගින කල හෙමින් සං – සාර කන්දේ වැටීමයි
වැටුණු පසු හෙටත් ඒ – මාර කන්දේ නගින්නේ

❃

අලසයා නිදන පැදුරට පෙමින්නේ
හිරු නැහැ කිසි දිනක හිනැහී වඩින්නේ
ඔහු පණ පිටින් පැදුරේ මිය ගොසින්නේ
ඔහුගේ පැදුර ගින්නෙන් නැහැ දැවෙන්නේ

❃

තරු අකුරු ගෙනැත් දී – නීල අහසෙන් කැමැත්තෙන්
හඳ එළිය සිනා සී – කවුළුවෙන් රෑ බලද්දී
මුළු ලොව මැ නිදා ඉන් – නා නිසොල්මන් වෙලාවේ
කවි ලියමි උපන්ගෙයි – කන්නවත් නෑ, කමෙක් නෑ

❃

හෙට යයි කියන්නේ
බොරුවක් බව සිතන්නේ
අද ළඟට ගන්නේ
රැගෙන මුව සිප සැනසියන්නේ

❃

සදහම් අමා බිඳු මා මුව'ගට පෙරුවේ
නොවහල් සුවඳ බැතියෙන් නැහැයට ඉරුවේ
සතියේ අග දිනේ නිසි ලෙස පෙරවරුවේ
ඉරුදින පාසලයි මා මිනිසකු කෙරුවේ

❃

කුසට බතයි ගතට වතයි ගෙයක් දෙරක් දීලා
හැම කෙනෙකු ම සැනසිය හැකි වේ හිස අත ගාලා
එවන් ඉසුරු ඔබ ලදහොත් තම නිදහස නහලා
ඔබ මැ තමා සැප මැද්දේ ඉපදුණු ලොකු වහලා

අප කුමට ද ගොස් නොරට සිඟන්නේ
අපේ ඉසුරු මව් පොළොවෙ තැවෙන්නේ
ඒවා ඉල්ලා වෙහෙස වෙයන්නේ
එවිට නො වේ දෝ නොවහල් වෙන්නේ

බලය ලැබූ කල රට ගිල ගන්නේ
මහජනයා ඔවුනට බිලි වෙන්නේ
දියුණුවෙ දෙව් දූ ඉවත දුවන්නේ
මෙව බලන්නද ඉර පායන්නේ

සිංහල පාරක ගමන් නොගත්තේ
සිංහල පැදුරක නිදා නොගත්තේ
සිංහල ගඟ දිය සිසිල නොදත්තේ
එවන් කෙනෙකු ගේ කුමක්ද තත්තේ

❋

දගබ් මහා වැව් බැන්දේ උඹයි පුතේ
සීගිරි ගලේ කවි ලිව්වෙ උඹයි පුතේ
නගුලෙන් එද රජ කෙරුවේ උඹයි පුතේ
පැදුරේ මෙද නිදියන්නේ උඹයි පුතේ

අමරස දිව බොජුන් ගිජු කුසයට වළඳා
සිලි සිලි සිනිඳු දිව සළු පිළි හැඳ පළඳා
මහජනයාට වැදි බණ කියමින බොළඳා
සැප විඳි එකා නිරයට නොයති ද මළ–ද

❋

නොරට ගොස් ඔබ සිඟන්නෙකුසේ බුදින අම බොජුනට වඩා
මගේ දේසයෙ සුණු සහල් බත මට රසයි පවසමි හඬා
බිම දමා මව් බසේ නාදය විදෙස් බසකින් දෙඩ දෙඩා
දෑ හිතැතියන් කියන මහ බොරු ඇසී දෙයි සවනට විඩා

ඉර හඳ අඳත් පායනවා හද අරණේ
මගෙ රට ණයට කැවේ නැහැ නොවැ පොරණේ
හෙළ දරුවන් එද මේ සිංහල දෙරණේ
ඔවුනගෙ ධහදියයි ලද උත්තම සරණේ

ඇඩෙනා කඳුළු මාගේ දෙපයට පැගේ
ඒවා අපායෙන් ලද ගිනි දළු වාගේ
එ නමුදු කමෙක් නැත දුක මසිතට නැහේ
මහජනයා මගෙයි – මම මහජන යාගේ

❁

පහක් වඩින වා
පහක් ගෙවෙන වා
හාම්පුතාලා මෙන් හැසිරෙන වා
එයින් අනේ ජනතාව පෙළෙන වා

❁

අපගේ කුසගිනි නිවන්න – නොරටින් බත අපට එපා
අපගේ ගත විළි වසන්න – නොරටින් වත අපට එපා
අපගේ දුක සැප බලන්න – පිට කෙනෙකුගෙ දෙනෙත එපා
අපගේ පැන විසඳලන්න – පිට රටවල නුවණ එපා

පැනයක් දුටු කල එය විසඳන්නා
එඩිතර සිතකින් එය පිළිගන්නා
එලෙස නොකර සකි ඉවත දුවන්නා
පැනය විසින් මහ වහලෙකු වන්නා

හොඳ නොහොඳ යන දෙක
දෙනෙතින් ගැඹුරු ලෙස දැක
කටයුතු කරන එක
නැණැති බව මම කියමි නැහැ සැක

බිය තරම් විස බීජයක් ගැන ලොවේ මා නැහැ වෙනත් දන්නේ
එයින් කොහොමද ගිලන් නොමවී ජීවිතේ රැක ,බලා ගන්නේ
දුබල සිතකයි බියෙහි රෝගය දරුණු විලසින් වැලඳ ගන්නේ
අචල එඩිතර මහා ඔසුවෙන් පමණි ඉන් අප සුව ලබන්නේ

දිව එන ජල කඳට ගල් පර නැත බාද
සුවසේ එය ගලයි වේගෙන් මඟ පාද
අවහිර දුටු තැනේ විරුවන් වැර ඇඳා
නොවහල් හිතින් දිරිමත් වෙයි සිත සාද

උත්සාහය උක් දණ්ඩක් වැන්නේ
වැළඳූ පසුවයි මිහිර දැනෙන්නේ
එහි රසයෙන් සිත සැනසී යන්නේ
අලස කටේ දිව එය නැහැ දන්නේ

❀

මගේ පැතුම පිවිතුරු නම් මා කුමට ද බිය වෙන්නේ
සෙස්සන්ගේ මුසාවලින් එය නැහැ නොවැ කළු වෙන්නේ
එයින් එසේ නම් කුමක්ද මගෙ පැතුමට සිදු වෙන්නේ
රං තැටියක් මදිනා ලෙස දීප්තියක් ඇති වෙන්නේ

❀

කිසිවක් මෙ ලොවින් නැත වුවමනා වුණේ
මා පැතු සියලු දේ ඇත බුදු අමා බණේ
දුක සැප තැනූ මේ ජීවිත නවාතැනේ
පමණට වඩා කිසිවකු නෑ පමා වුණේ

සමනොළ ගිර’ග අරුණලු හිනැහෙන වෙලේ
ඇන්ද අඹරහත මීදුම් සුදු සේලේ
එය මා මුලින් දැක ගත්තේ ළා බාලේ
එදිනයි මට ලැබුණෙ සරසවියගෙ ආලේ

පැසසුම ද ගැරහුම
එක ලෙස සලකමින් මෙම
සිතුවිලි කවි කුසුම
නිහතමානි ව පුදන්නෙමි මම

—ආර්. ප්‍රේමදස

REFERENCE



එතුමාට දෘඪ ආත්ම ශක්තිය හා අධිෂ්ඨාන බලය ප්‍රබල ලෙස පහළ වූයේ පරාජයේදීත් පරිහාසයේදීත්ය. එයින් පන්නරය ලද චරිත ශක්තියත්, ආත්ම විශ්වාසයත් ඇති එතුමා දීර්ඝ දුර්ග මාර්ගයේ ඉදිරියටම ඇදී ආවේය. කරදර දුක් ගැහැට, අපහාස උපහාස හා ගෙරවුම් මැද එතුමා පැමිණි ඒ දුෂ්කර ගමන අපටද අපගේ ආත්ම ශක්තිය හා අධිෂ්ඨාන බලය මතුකර ගන්නට අනුබල දෙයි.

මහත් වූ වගකීම් සමූහාරයක් දරමින්, ඒ සියල්ල සපුරා ඉටුකරන ගරු ආර්. ප්‍රේමදාස අගමැතිතුමන්ගේ කාර්‍ය බහුල ජීවිතය ගැන සිතන විට එතුමාට පතක් පොතක් ලියන්නට තබා පතක් පොතක් කියවන්නටවත් විවේකයක් ඇතැයි නො සිතේ. එහෙත් එතුමා සැහැල්ලු ලෙසින් වගකීම් දැරීමට අවශ්‍ය වූ ආත්ම ශක්තිය හා ආත්ම සංයමය ලද්දේ නිබඳවම විචාර බුද්ධියෙන් යුතුව බොහෝ පත පොත කියවා රැස්කරගත් අවබෝධයෙනි. ලිවීමෙන් හා අලුත් දෑ ක්‍රියාත්මක කිරීමෙන් ලද අත්දැකීම් ද එතුමාගේ ආත්ම ශක්තිය හා ආත්ම සංයමය දියුණු කිරීමෙහිලා මහෝපකාරී විය. එතුමා තරම් ලියන හා කියවන අන් කිසිදු තැනැත්තෙක් දේශපාලඥයින් අතර නැති බව එතුමා ළඟින් ඇසුරු කරන්නෝ දනිති. දහසක් වැඩ රාජකාරි අතරතුර ලබන සුළු විවේකයකදී ඔහු දින පොතක් එළියට ඇද තමා එහි ලියූ කවියක්.ගියක් හෙමිහිට මුමුනයි. එතුමාගේ ජීවිතයේ දක්නට ලැබෙන මට සිළිටි බව හා නිහතමානී කම, කලාකරුවකු වශයෙන් එතුමා තුළ ඇති තියුණු වින්දන ශක්තියේත්, නිර්මාන කුසලතාවයේත් අග්‍ර ඵලයකි.

කාර්‍ය බහුලව ගතට වෙහෙස දැනෙන විට මධු විතක හෝ දුම් වැටියක හෝ පිහිටක් කිසි විටෙකත් නොපතන එතුමා තම සිත තමන්ගේම ළමා අවධිය වෙත හෝ සමාජයේ පැගෙන තැන වෙසෙන ජනතාව වෙත හෝ යවයි. දයාව දර්ශනයට මුහුව ආවේග තුළින් සිතිවිලි පහළ වේ. එවේලෙහිම දින පොත පෙරළා ලියයි. ලියා ඔප දමයි. 1976 වසරේ එතුමා අතින් බිහිවූ 'රසකවි සිතුවිලි' එතුමා තමන්ගේ වෙහෙස නිවා ගැනීමට ගත් සම්‍යක් මාර්ගයක උදාර ප්‍රතිඵලයකි. මේ එහි දෙවන මුද්‍රණයයි.

මිල රු. 6.00 යි.

දයාවංශ ජයකොඩි සහ සමාගම

PRESI
LIB